ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2387/03 - 2024 ජූනි මස 03 වැනි සඳුදා - 2024.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 5 වන නියෝගය යටතේ වන නියමය

2012 මැයි මස 15 වන දින අංක 1758/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල කාර්යය සඳහා පත්කරන ලද නිසි බලධරයා වන ගබඩාගේ දොන් හරිස්චන්ද්‍ර කමල් ගුණරත්න වන මම, ඉහත කී නියෝගවල 5 වන නියෝගය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින්, මේ නියමය මගින්, කලින් කලට සංශෝධිත සහ 2024 ජූනි මස 03 වැනි දින අංක 2387/02 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ලැයිස්තුවට කරන ලද සංශෝධනය මගින් අවසන් වරට සංශෝධිත, ඉහත කී නියෝගවල 4 වන නියෝගය යටතේ නම් කර ඇති සහ ලැයිස්තුගත කර ඇති සහ 2014 මාර්තු මස 21 වැනි දින අංක 1854/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකුට, කණ්ඩායමකට හෝ අස්ථිත්වයකට අයිතිව තිබෙන හෝ ඔවුන් සතු හෝ ඔවුන් විසින් දරනු ලබන සියලු අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් මේ නියමය මගින් ක්‍රියා විරහිත කරමි.

2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 5 වන නියෝගය යටතේ සාදන ලද 2014 මැයි මස 22 වැනි දින අංක 1863/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් අවලංගු කරනු ලැබේ.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

නිසි බලධරයා.

2024 ජූනි මස 03 වැනි දින.
කොළඹ දී ය.

EOG 06 - 0009

1A - G 42006 — 04 (2024/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*